කොවිඩ්-19 තත්වයේදී මිය ගිය අයෙකුගේ මළ සිරුර සම්බන්ධයෙන් ආරක්ෂිතව කටයුතු කිරීම සහ ආසාදනය පැතිරීම වැළැක්වීම පිළිබඳ අතුරු නිර්දේශ මාලාවක්, ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් 2020 මාර්තු 24 වන දින නිකුත් කොට ඇත. මෙම නිර්දේශ මාලාවට අනුව, දේහයන් ආදාහනය කිරීම හෝ භූමදානය කිරීම යන විකල්පයන් තෝරාගත යුත්තේ සංස්කෘතිකමය කාරණා සහ සම්පත් වලට අනුව පමණක් වේ. එසේම බෝ වන රෝගයකින් මිය යන්නෙකු ආදාහනය කළ යුතු යැයි කීම ජනප්‍රිය මිත්‍යාවක් මිස සත්‍යයක් නොවන බවද එහි සඳහන් වේ.

කෙසේ නමුත් ලංකාදීප පුවත්පතේ කතුවැකියේ සඳහන් වන්නේ, කොවිඩ් ආසාදිතයෙකු මිය ගිය විට එම මළසිරුරු ආදාහනය කළ යුතු බව ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහ සෞඛ්‍ය විශේෂඥයන්ගේ මතය බවයි. කෙසේ වෙතත්, ලංකාදීප පුවත්පතේ (11/15) 06 පිටුවේ "කොරෝනා මෘත ශරීර භූමදානය සුදුසුද?" යන සිරස්තලයෙන් යුතු ලිපිය තුළ ලෝක සෞඛ්‍ය සංවිධානයේ අතුරු නිර්දේශ මාලාව උපුටා දක්වමින් සඳහන් කෙරෙනුයේ, කොවිඩ්-19 තත්වයේදී මිය ගිය අයෙකුගේ දේහය භූමදානය හෝ අදාහනය කිරීමට ලෝක සෞඛ්‍ය සංවිධානය බාධා නොකරන බවයි.

මූලාශ්‍ර උපුටා දක්වමින් සාවද්‍ය තොරතුරු පළ කිරීම ඔස්සේ ඉරිදා ලංකාදීප කතුවැකිය මාධ්‍ය ආචාර ධාර්මික වරදක් සිදුකර ඇති බවට සැක නැත. එනමුත්, එම පුවත්පතේම වෙනත් පිටුවක වූ වෙනත් ලිපියක මේ සම්බන්ධයෙන් නිවැරදි මූලාශ්‍ර උපුටමින් නිවැරදි තොරතුරු දක්වා තිබෙන අතරම කතුවැකිය තුළ සාවද්‍ය තොරතුරු දක්වා ඇති බවද පෙන්වා දිය යුතු වේ.

මූලාශ්‍ර: https://apps.who.int/iris/bitstream/handle/10665/331538/WHO-COVID-19-lPC_DBMgmt-2020.1-eng.pdf

සැලකිය යුතුයි: ඉහත සඳහන් වන කරුණු පදනම් වී ඇත්තේ අදාළ පෝස්ටු පළ කෙරෙනා මොහොත වන විට ලබාගැනීමට තිබූ වඩාත්ම යාවත්කාලීන තොරතුරු මත බව කරුණාවෙන් සලකන්න. ස්තුතියි.

#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #SinhalaNews #SundayLankadeepa